www.kidworship.kr

# යේසුස්වහන්සේ සුව කළ සේක
## (අංශභාගරෝගයාට සුවය දීම )

-Jesus Heals (The Paralyzed man)-


36Page

**පොතේ ගුරා** එදා ඉශ්රායෙල් හී සිටිය සෑමකෙනෙක්ම පාහේ රෝගීන් සුවකරන යේසුස්වහන්සේ පිළිබඳව අසා තිබුණා. මේ හේතුවෙන් යේසුස්වහන්සේ යන කොයි තැනක නමුත් ජනතාව රැස්වීගෙන සිටිනවා.
දවසක්දා යේසුස්වහන්සේ කපර්ණවුම නම් කුඩා නගරයට එනවා.

**ජනතාව** යේසුස් ක්‍රිස්තුස්වහන්ස, සුපර් ස්ටාර්.. !! (සුපිරි තරුව)

**පොතේ ගුරා** අශංභාගරෝගීයෙක් කපර්ණවුමේ සිටියා. ඔහුට ඇවිදින්නත් බෑ... හරියට කෑමක් කන්නත් බෑ...

**අශංභාගරෝගියා** අනේ... මට හරිම දුකයි. මට ඇවිදගන්නත් බැරිව ඉද්දී මම කොහොමද ගිහින් යේසුස්වහන්සේව බලන්නේ !

**මිතුරන්** අපි ඔයාට උදව් කරන්නම්...!!

........................................................................................................


37Page

**පොතේ ගුරා** අංශභාගරෝගීයාගේ මිතුරන් එකතුවෙලා ඔහුව යේසුස්වහන්සේ වෙතට රැගෙන ගියා. මේ මිතුරන් එකතුවෙලා, ඝන රෙද්දකින් සහ දැවවලින් අංශභාගරෝගියාව උසුලාගෙන යා හැකිවන ආකාරයේ යහනාවක් සෑදුවා. උස්සන්න... උස්සන්න... කියමින් තමතමුන්ගේ ශක්තිය පාවිච්චි කර, යේසුස්වහන්සේ සිටි ස්ථානයට ඔහුව රැගෙන ගියා.

........................................................................................................


38Page

**පොතේ ගුරා** ඒත් ... යේසුස්වහන්සේ දැකීමට බොහෝ ජනතාවක් පැමිණ සිටිය හෙයින් මේ අයට ඉඩක් ලැබුණේ නම් නෑ. දොරෙන් ඇතුල්වෙන්න කො-හොමටවත් බෑ. ඒ අයට පියාපත් හරි තිබුණා නම්... ඒ වුණාට ඉතිං...

**පළමු මිතුරා** පියාපත්...ආ ... ඒක නියම අදහසක් ...!!

**පොතේ ගුරා** සමාවෙන්න ??

**මිතුරන්** ඔව්, අපි උඩට යං !

**පොතේ ගුරා** සමාවෙන්න ...!! මොකක්ද? ...!!

........................................................................................................


39Page

**පොතේ ගුරා** අහෝ හිතවත... මිතුරන් එක්ව වහලය උඩට නැගලා, යේසුස්වහන්සේ සිටින ස්ථානය වෙතට වහලයේ හිලක් හදන්න පටන් ගත්තා.

**පළමු මිනිසා** (ලොකු සද්දයක් ඇහිලා) හුහ්... බලන්න !

**දෙවන මිනිසා** වහලේ ... වහලේ කඩන් වැටෙනවා !!

**තුන්වන මිනිසා** ආහ්හ්හ්හ්... ආහ්...

**පොතේ ගුරා** ගෙදර සිටි සියල්ලෝම කම්පනය වී තිගැස්සී වහලය දෙසට නෙත් දල්වා බලනවා. මිතුරන් එකතුවෙලා ලණුවලින් ගැටගැසූ අංශභාගරෙ-ෝගියා තැබූ යහනාව යේසුස්වහන්සේ සිටි ස්ථානයට බැස්සුවා. පරිස්ස-මෙන්... පරිස්සමෙන්... අන්ක ඒ ආකාරයෙන් අංශභාගරෝගියාට යේසුස්වහන්සේ වෙතට යන්නට පුලුවන් වුණා.



40Page

| | |
|---|---|
| පොතේ ගුරා | යේසුස්වහන්සේ, මේ මිතුරන්ගේ ඇදහිල්ල දැක ඔවුන්ට ප්‍රශංසා කළා. ඉන්පසු යේසුස්වහන්සේ අංශභාගරෝගියාට කතාකොට, |
| යේසුස්වහන්සේ | පුතා, ඔයාගේ පාපය කමාකළා. දැන් නැගිට ඔයාගේ යහන රැගෙන ගෙදර යන්න! |
| පොතේ ගුරා | යේසුස්වහන්සේ කතාකර නිමවූ සැණින්, නැගිට ගන්නට නොහැකිව සිටි මිනිසා, එකපාරටම නැගිට උන්වහන්සේට ස්තූති ප්‍රශංසා කළේය. |
| අංශභාගරෝගියා | නියමයි ! සෙලවෙන්න පුලුවන් ! ඇවිදින්න පුලුවන් ! යේසුනි ගොඩක් ස්තූතියි. ගොඩක් ස්තූතියි. |
| පොතේ ගුරා | අංශභාගරෝගියා ස්තූති ප්‍රශංසා කරමින් දෙවියන්වහන්සේට මහිමය දුන්නා. ඉන්පසු ඔහු තමාගේ ඔත්යහන උස්සගෙන ගෙදරට ගියා. මෙය දුටු සියල්ලෝ විශ්මපත්ව දෙවියන්වහන්සේට ප්‍රශංසා කළා. |
| ජීවිතයට අදාල කිරීම | දුවේ පුතේ, හොඳට බලන්න වටපිටාව දෙස. ගොඩක් මිනිසුන් අසරණකමින් තනිකමින් ඉන්නවා නේද? මේ අය වෙනුවෙන් මොකක්ද කරන්න පුලුවන්. පළමුව ඒ අය ගැන යාච්ඤා කරන්න. ඇත්තටම නම කියා යාච්ඤා කරන්න. දෙවනුව කරන්න ඕන දේ යේසුස්වහන්සේ ඔයාගේ හිතට කතා කරයි. |